සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

25A | S | I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය .....

ඉන්දියා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම/ස්ථාන 5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමඟ නොගැලපේ. නොගැලපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන් තුළ ලියන්න.**

01. 1. ක්‍රිෂ්ණ 2. තුංගභද්‍රා 3. බ්‍රහ්මපුත්‍ර
4. කාවේරි 5. ගෝදාවරී (.....)

02. 1. ඍතු සංහාරය 2. මාලවිකාග්නි මිත්‍ර 3. රඝු වංශය
4. මහා භාරතය 5. ශාකුන්තලය (.....)

03. 1. මොහොන්ජොදාරෝ 2. කලිබන්ගන් 3. ලෝතාල්
4. රාමේෂ්වරම් 5. චන්හුදාරෝ (.....)

04. 1. නාලන්දා 2. උජ්ජෙයිනි 3. වික්‍රමශීලා
4. ජගද්දලා 5. ඕදන්නපුරි (.....)

05. 1. ස්ට්‍රාබෝ 2. ප්ලීනි 3. කල්හාණ
4. හෙරඩෝටස් 5. ටොලමි (.....)

06. 1. පකුධ කච්චායනා 2. පුර්ණ කස්සප 3. ගෞතම බුද්ධ
4. මක්ඛලී ගෝසාල 5. අජිත කේශකම්බල (.....)

07. 1. චම්පා 2. රාජගෘහ 3. සාංචි
4. උජ්ජෙයිනි 5. කෞෂම්බි (.....)

08. 1. සිසුනාග 2. නන්ද 3. හර්යංක
4. පුෂ්‍යමිත්‍ර 5. මෞර්‍ය (.....)

09. 1. මණ්ඩප 2. ගර්භගෘහ 3. අන්තරාල
4. චෛත්‍යශාලා 5. විමාන (.....)

10. 1. ධර්මපාල 2. දේවපාල 3. ගෝපාල
4. මහේන්ද්‍රපාල 5. නාරායනපාල (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11.
1. අයිහෝල් - II පුලකේශින්
2. ධෞලි - අශෝක
3. ජුනාගාද් - රුද්‍රාදාමන්
4. හිටරි - II චන්ද්‍රගුප්ත
5. හතිගුම්හ - බාරවේල (.....)

12.
1. දන්ත දේවි - සමුද්‍රගුප්ත
2. ධ්‍රැව දේවි - II චන්ද්‍රගුප්ත
3. මුරා - අශෝක
4. රාජ ශ්‍රී - ග්‍රහවර්මන්
5. කෝසල දේවි - බිම්බිසාර (.....)

13.
1. එල්ලෝරාහි කයිලාසනාථ දේවාලය - රාෂ්ට්‍රකූට
2. තංජෝර්හි බ්‍රෘහදීශ්වර දේවාලය - චෝළ
3. බෙලූර්හි චෙන්නකේශව දේවාලය - හොයිසාල
4. බජුරාහෝගි කන්දරීය මහා දේවාලය - වාකාටක
5. මහබලිපුරම්හි රථ දේවාලය - පල්ලව (.....)

14.
1. ඉන්ද්‍රප්‍රස්ථ - දිල්ලි
2. සාගල - සියල්කොට්
3. ප්‍රයාග - අවුරංග්බාද්
4. පුරුෂපුර - පෙෂවෝර්
5. සෞරාෂ්ට්‍ර - කතියවාර් (.....)

15.
1. කාලිංග - චේදි
2. වරංගල් - කාකටිය
3. වාතාපි - හොයිසාල
4. වලභි - මෛත්‍රකයෝ
5. කනෞජ් - සාතවාහන (.....)

- **අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිලිවෙලට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

X	Y
1. අජන්තා	A පල්ලව රථ
2. මහාබලිපුරම්	B හින්දු දේවාල
3. මථුරා	C ගුහා චිත්‍ර
4. නාලන්දා	D බෞද්ධ අධ්‍යාපන ආයතනයක්
5. තංජෝර්	E බුද්ධ ප්‍රතිමා

1. BEDCA 2. CAEDB 3. ADCBE 4. ECBAD 5. DBAEC (.....)

17.

X	Y
1. මස්කි සුළු ගිරි ලිපිය	A ගෞතමී බාලාශ්‍රී
2. හිටරි සෙල්ලිපිය	B ස්කන්ධ ගුප්ත
3. නාසික් සෙල්ලිපිය	C දෙවෙනි පුලකේශීන්
4. ජුනාගාද් සෙල්ලිපිය	D අශෝක
5. අයිහෝල් සෙල්ලිපිය	E රුද්‍රදාමන්

1. ADCBE 2. BEDCA 3.CAEBD 4. DBAEC 5. ECBAD (.....)

18.

X	Y
1. ව්‍යාකරණ	A සුර්ධ සිද්ධාන්ත
2. තාරකා ශාස්ත්‍ර	B රාජතරංගණිය
3. දර්ශනය	C මහාභාෂ්‍ය
4. මහා කාව්‍ය	D රඝුවංශය
5. ඉතිහාසය	E සංඛ්‍යාසුත්‍ර

1. ADCBE 2. BEDCA 3. CAEDB 4. DBAEC 5. ECBAD (.....)

19.

X	Y
1. අන්තර්වසිත	A අයකැමි
2. මන්ත්‍රී - පර්ෂද්	B අමාත්‍ය මණ්ඩලය
3. සමාහර්ත	C නගර පාලන
4. අන්තපාල	D අන්තඃපුර පාලක
5. නාගරක	E දේශසීමා ආරක්ෂක

1. ADCBE 2. BEDCA 3. CAEDB 4. DBAEC 5. ECBAD (.....)

20.

X		Y
1. මිනැන්ඩර්	A	වයඹදිග ඉන්දියාව පාලනය කළ ඉන්දු ග්‍රීක පාලකයෙකි.
2. සන්ද්‍රාකොට්ටාස්	B	ඉන්දියාව ආක්‍රමණය කළ හූණ නායකයා
3. නහපාන	C	චන්ද්‍රගුප්ත මෞර්ය හැඳින්වූ ග්‍රීක නාමය
4. තෝරමාන	D	බටහිර හා මධ්‍ය ඉන්දියාව පාලනය කළ ශක පාලකයා
5. අග්‍රනොමි	E	මෞර්ය ප්‍රදේශ පාලන භාරව සිටි නිළධාරියා

1. ABECD 2. ACEBD 3. ACDBE 4. AEDBC 5. ADEBC (.....)

- **අංක 21 - 25 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

21. මහා නාන තටාකය පිහිටි නගරය කුමක්ද?
1. මෙහොන්ජොදාරෝ 2. හරප්පා 3. ලෝතාල්
4. රූපාර් 5. කලිබන්ගන් (.....)

22. බෞද්ධ සාහිත්‍යයට අනුව ගණ රාජ්‍ය නොවන ආණ්ඩු ක්‍රමයක් පැවතියේ කොහේද?
1. කෝලිය 2. ලිච්ඡවී 3. අවන්ති
4. විදේහ 5. මල්ල (.....)

23. සිය පියා මිය යන විට අශෝක පාලනය කරමින් සිටියේ කුමන නගරයේ ප්‍රදේශීය ආණ්ඩුකාරවරයා ලෙසද?
    1. තක්ෂිලා 2. උජ්ජෙයිනිය 3. කෝසලී
    4. ස්වර්ණගිරි 5. පාඨලී පුත්‍ර (.....)

24. සතවාහන රාජ වංශයේ ආරම්භක රජ වුයේ කවුරුන්ද?
    1. කෘෂ්ණ 2. ගෞතමී පුත්‍ර 3. සීමුක
    4. ශ්‍රී යාඥ 5. I සාතකර්ණී (.....)

25. භාරුකච්ඡ වරායෙන් මුහුදට ගලායන ගංගාව කුමක්ද?
    1. තප්ති 2. කෘෂ්ණ 3. නර්මදා
    4. කාවේරි 5. මහානදී (.....)

- **අංක 26 - 30 දක්වා සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. ඉන්දු නිම්න වැසියන්ගේ සමාජ ජීවිතය
    1. එහි වැසියෝ බාර්ලි, වී, තිරිඟු හා මෑ වර්ග ආදී ධාන්‍ය වගා කළහ.
    2. ස්ත්‍රීහු මාළ, වළලු, මුදු ආදී ආභරණ පැළඳීම.
    3. එහි වැසියෝ මව් දෙවගන වන්දනා කළහ.
    4. ඉන්දු නිම්න වැසියෝ සුමේරියාවෙන් කපු ආනයනය කළහ.
    5. මොහොන්ජොදාරෝවෙන් හමු වී ඇති ඇටසැකිලි අවශේෂ කැලිකොලිතික යුගයට අයත් යැයි සැලකේ. (.....)

27. නාලන්දා විශ්ව විද්‍යාලය
    1. ගුප්ත අවධියේ ආරම්භ විය.
    2. මහායාන බෞද්ධ මධ්‍යස්ථානයකි.
    3. පාහියං හිමි මෙහි අධ්‍යාපනය ලැබූ දීප්තිමත් ශිෂ්‍යයෙකි.
    4. පාලවරුන්ගේ නොමද අනුග්‍රහය එයට ලැබිණි.
    5. ජාත්‍යන්තර කීර්තියට පත් අධ්‍යාපනික මධ්‍යස්ථානයකි. (.....)

28. මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයාගේ ඉන්දියානු ආක්‍රමණය
    1. ආක්‍රමණය එල්ල වුයේ ක්‍රි.ව. හතරවන සියවසේ දී ය.
    2. එවිට උතුරු වුයේ ඉන්දියාවේ පාලකයා වුයේ ධනනන්දය.
    3. වයඹ දිග ඉන්දියාවට ආක්‍රමණය එල්ල වුයේ ය.
    4. බිසස් නදිය තරණය කර රට ඇතුළට ආක්‍රමණය එල්ල නොකලේ හමුදාවල අකමැත්ත නිසාය.
    5. ඔහු ඉන්දියාවෙන් නික්ම ගියේ මක්‍රාන් දුර්ගය හරහාය. (.....)

29. බුද්ධ ධර්මය හා ජෛන ධර්මය අතර සමානතා,
    1. නිර්වාණය පිළිබඳ විශ්වාසය
    2. කර්මය පිළිබඳ විශ්වාසය
    3. අවිහිංසාවාදය විශ්වාස කිරීම.
    4. අත්තකිලමතානුයෝගය ප්‍රගුණ කිරීම.
    5. වේද ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම. (.....)

30. ගුප්ත යුගයේ විශිෂ්ඨ ලේඛකයන්
    1. ශූද්‍රක 2. හරිසේන 3. කල්හාණ 4.භාස 5. විශාඛදත්ත (.....)

- **අංක 31-35 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති A,B,C, හා D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

Aහා B පමණක් නිවැරදි නම් අංක 1 ද B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද

C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය				
1	2	3	4	5
A සහ B පමණක් නිවැරදිය.	B සහ C පමණක් නිවැරදිය.	C සහ D පමණක් නිවැරදිය.	A හා C පමණක් නිවැරදිය.	ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය.

31. අශෝක රජුගේ ආගමික ප්‍රතිපත්ති
A) රටවැසියාගේ සුව පහසුව සලකා කටයුතු කළේය.
B) අශෝක රජුගේ කාලයේ තෙවන මහායාන බෞද්ධ සංඝායනාව පැවැත්වීය.
C) රජතුමා අසුහාර දහසක් වෙහෙර විහාර කරවන ලදී.
D) අශෝක රජු ජෛන ආගමිකයෙකි. (.....)

32. 'මහා භාරතය' කාව්‍ය පිළිබඳව පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
A) මහා භාරතයේ කතුවරයා වාල්මීකී පඬිවරයා ය.
B) මෙය ලෝකයේ ඇති දීර්ඝතම තනි කාව්‍ය වන අතර වීර කාව්‍යයකි.
C) ඉන්දීයාවේ කුරු ක්ෂේත්‍රයේ සිදු වූ මහා සටනක් මෙහි විස්තර වේ.
D) මහා භාරතය ක්‍රි.පු. 1500- ක්‍රි.පූ. 1000 ක් අතර සියවස්වල හටගත් සිදුවීම සම්බන්ධයෙන් වැදගත් වේ. (.....)

33. මගධ රාජ්‍යයේ බිම්බිසාර රජතුමා
A) මගධයේ පළමුවන වැදගත් රජු මෙතුමාය.
B) දේශපාලනය පිළිබඳ දුරදක්නා නුවණින් කටයුතු කළේය.
C) විවාහ සබඳතා මගින් රාජ්‍ය ව්‍යප්ත කර ගැනීමට කටයුතු කළේය.
D) ක්‍රි.පු. 8 වන ශත වර්ෂයේ දෙවන භාගයේ මෙතුමා මගධයට පැමිණියේ ය. (.....)

34. ගුප්ත යුගයේ ආගමික පසුබිම,
A) ගුප්ත යුගයේ බ්‍රාහ්මණ ආගම පිරිහීමට පත්විය.
B) භගවත් ගීතාව ජෛන ආගමික ග්‍රන්ථයකි.
C) බුදුන් වහන්සේ විෂ්ණු දෙවියන්ගේ දසවෙනි අවතාරය ලෙස සලකයි.
D) සංකාරිකා දර්ශනය, යෝග දර්ශනය අටුවාව, මෙකල රචනා විය. (.....)

35. චාලුක්‍ය හා පල්ලව ගැටුම්
A) මෙම දෙපිරිස අතර නිතරම ගැටුම් ඇති විය.
B) I නරසිංහවර්මන් රජු 'මාමල්ල' නම් විරුදාවලිය ලැබුවේය.
C) II පුලකේශීන්ගේ මරණින් පසු උතුරේ චාලුක්‍ය බලය වර්ධනය විය.
D) I පරමේශ්වර්මන්ගේ ක්‍රි.ව. 690 - 700 කාලයේ පල්ලව බලය දුර්වල විය. (.....)

- **36 සිට 40 දක්වා ප්‍රශ්නවල අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4, හා 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
1. නිවැරදිය	නිවැරදිය
2. නිවැරදිය	වැරදිය
3. වැරදිය	වැරදිය
4. වැරදිය	නිවැරදිය
5. නිවැරදිය	නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි.

පළමු වැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
36. ගන්ධාර කලා කෘති හමුවන්නේ වයඹ දිග ඉන්දියාවේ හා ඇෆ්ඝනිස්ථානයේය.	ක්‍රි.ව. 10 වෙනි සියවසේ දකුණු ඉන්දියාවේ කළ්‍යාණියේ චාලුක්‍යයන් රාජ්‍යයක් ගොඩනැංවීය. (.....)
37. වික්‍රමශීලා විශ්ව විද්‍යාලය සාදවන ලද්දේ බෙංගාලයේ ධර්මපාල රජුය.	බුදු දහම හැදෑරීමේ ආයතන පනහක් සමග මේ රජු විසින් කරවන ලදී. (.....)
38. පළමුවන නරසිංහ වර්මන් රජු පල්ලව රජවරුන් අතර 'ශ්‍රේෂ්ඨතමයා' ලෙස සැලකේ.	පල්ලව රජවරු ශිව හා විෂ්ණු භක්තිකයෝ වූහ. (.....)
39. I චන්ද්‍ර ගුප්ත විවාහ සම්බන්ධතා අධිරාජ්‍ය ව්‍යාප්ති කර ගැනීමට උප ක්‍රමයක් ලෙස භාවිතා කළේය.	සමුද්‍ර ගුප්තට පසු ඔහුගේ පුත් II චන්ද්‍රගුප්ත බලයට පත්විය. (.....)
40. II චන්ද්‍රගුප්ත රජ දවස හුණයන්ට විරුද්ධ සටන් කොට පැරදවීය.	ඉන්දියාවට හූණ ආක්‍රමණ එල්ල කරන ලද්දේ ඩිමෙට්‍රියස්ගේ ප්‍රධානත්වයෙනි. (.....)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

25A | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය .....

ඉන්දියා ඉතිහාසය II

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i)	මෙහෙන්දඵොදාරෝ	(v)	බැරෝඩා
(ii)	සුප්පාරක	(vi)	අයිහෝල්
(iii)	තප්ති ගඟ	(vii)	කාවේරි පටුන
(iv)	සුලෙයිමාන් කඳුවැටිය	(viii)	උජ්ජෙයිනි

නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි. (ල.18)

02. ඉන්දියානු ඉතිහාසය හැඩගැන්වීමෙහිලා වයඹ දිග කපොලු බලපෑ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 14)

03. බිම්බිසාර රජුගේ සිට අශෝක රජුගේ පාලන සමයේ අවසාන දක්වා මගධයේ නැගීමට තුඩුදුන් සාධක කවරේදැයි පරීක්ෂා කරන්න. (ල. 14)

04. මෙහොන්ජොදාරෝ - හරප්පා ශිෂ්ඨාචාරය ලොව පැරණිම නාගරික ශිෂ්ටාචාරවලින් එකකි.

(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශවල මුල් අවධියේ දී කැණීම් කළ පුරා විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(ii) මොහෙන්ජොදාරෝ හා හරප්පා නගර අසලින් ගලායන ගංගා දෙක නම් කරන්න. (ල. 2)

(iii) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)

(iv) ඉහත සඳහන් ප්‍රකාශය නගර සැලැස්ම කෙරෙහි විශේෂ අවධානයක යොමු කරමින් පරීක්ෂා කරන්න. (ල. 7)

05. ''චන්ද්‍රගුප්ත මෞර්ය ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍ය විය'' මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ල. 14)

06. ගුප්ත අධිරාජ්‍ය බිඳ වැටීමට ප්‍රධාන සාධකය වුයේ හූණ ආක්‍රමණයන්ය.'

(i) ගුප්ත අධිරාජ්‍ය බිඳ වැටෙන අවධියේ එහි සිටි පාලකයා සහ ගුප්ත අධිරාජගේ අවසාන පාලකයා නම් කරන්න. (ල. 2)

(ii) ගුප්ත අධිරාජ්‍යයට ආක්‍රමණ එල්ල කළ හූණ නායකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 4)

(iii) හූණයන් විසින් අල්ලා ගත් ගුප්ත රාජ්‍ය ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල. 3)

(iv) ගුප්ත අධිරාජය පරිහානිය ඉහත ප්‍රකාශය ඇසුරෙන් විස්තර කරන්න. (ල. 7)

07. අශෝක අධිරාජ්‍යයාගේ අරමුණ වූයේ මහජන සුභ සාධනය අරමුණු කොටගත් රාජයක් ගොඩනැගීමයි'' මෙය විස්තරාත්මක සාකච්ඡා කරන්න. (ල. 14)

08. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකකට ඓතිහාසික සටහන් ලියන්න.
(i) වයඹ දිග ඉන්දියාවට එල්ල වූ අරාබි ආක්‍රමණ
(ii) ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ සොළොස් මහා ජනපද
(iii) ගුප්ත පාලකයන්ගේ සාහිත්‍ය
(iv) කුෂාණයන් යටතේ බෞද්ධ සංස්කෘතික අභිවර්ධන

09. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පිළිතුරු සපයන්න.
(A) චෝළ පරිපාලනයේ දක්නට ලැබෙන මුඛ්‍ය ලක්ෂණ පරීක්ෂා කරන්න.
නැතහොත්
(B) කාංචියේ පල්ලවයන් යටතේ සිදු වූ සංස්කෘතික අභිවර්ධනය විස්තර කරන්න.
(ල. 14)

12 / 13 ඉන්දියා ඉතිහාසය - 12 / 13 இந்திய வரலாறு

විභාග අංකය
சுட்டெண்



තෙවන වාර පරීක්ෂණය - ඉන්දියා ඉතිහාසය.
පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස

1.	3	11.	4	21.	1	31.	4
2.	4	12.	3	22.	3	32.	2
3.	3	13.	4	23.	2	33.	5
4.	2	14.	3	24.	3	34.	3
5.	3	15.	3	25.	3	35.	1
6.	3	16.	2	26.	4	36.	2
7.	3	17.	4	27.	3	37.	5
8.	4	18.	3	28.	1	38.	1
9.	4	19.	4	29.	4	39.	4
10.	4	20.	3	30.	3	40.	3

(ලකුණු 40)

11 පත්‍රය - පිළිතුරු



01. කරුණු දක්වා ඇත ආකාරයට සුදුසු පරිදි පිළිතුරු ලබා දෙන්න.

02. **වයඹ දිග කපොලු**
* බයිබර් දුර්ග මාර්ගය - කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් දක්වා
* බෝලාන් දුර්ග මාර්ගය - සුලෙයිමාන් කඳුවලට බටහිරින් පිහිටා ඇත.
* මක්‍රාන් දුර්ග මාර්ගය - කිර්තාර් කඳු හා අරාබි මුහුදු අතර පිහිටා ඇත.
* හේරාත් දුර්ග මාර්ගය - ඇෆ්ඝන් කඳු ආශ්‍රිත ප්‍රදේශයේ සිට සිංදු ගංඟා නිම්නය දක්වා
* අග්නාන්, සුලෙයිමාන්, කිර්තාර්, හින්දුකුෂ් කඳු ආශ්‍රිතව වයඹ දිග කපොලු මාර්ග පිහිටා තිබීම.
* බටහිර ආසියාව හා ඉන්දියාව අතර සම්බන්ධතා තහවුරු කරනු ලැබුවේත් ඉන්දියාවට බටහිර ලෝකය සමඟ සබඳතා පවත්වා ගෙන යනු ලැබුවේත් මෙම දුර්ග මාර්ග ඔස්සේ වීම.

* කපොලු ඔස්සේ ඉන්දියාවට සංක්‍රමණය වූ මුල් ජනපදිකයින් ඉන්දියාවේ දේශපාලන, සමාජ හා ආර්ථික පරිවර්තනයක් ඇති කිරීම.
* ඉන්දියානු දේශපාලන ආධිපත්‍ය මෙන්ම ආගම, සංස්කෘතිය හා දර්ශනය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත කිරීම සිදු වූයේ වයඹ දිග කපොලු ඔස්සේ ය.
* ග්‍රීක, ඉස්ලාම් හා මෝගල් ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම, මූර්ති කලාව, හා චිත්‍ර කලාව වැනි සංස්කෘතික අංගවලින් ඉන්දියානු ඉතිහාසය පෝෂණය වීම.
* ඉන්දියාවෙන් පිට මධ්‍ය ආසියාව. චීනය දක්වා බුදු දහම ව්‍යාප්ත වීම සහ මධ්‍ය ආසියාවේ බෞද්ධ මධ්‍යස්ථාන ආරම්භ වීම.
* දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණි දේශගවේෂණයන් සමකාලීන ඉන්දියානු ඉතිහාසය පිලිබඳව තොරතුරු අනාවරණය කර තිබීම.
* වයඹ දිග ඉන්දියානු කපෙලු ආරක්ෂා කර ගැනීමට ඉන්දියානු පාලකයන් කොතෙක් උත්සාහ දරනු ලැබුවද ඉතිහාසය පුරාම වයඹ දිග දුර්ග මාර්ග අනාරක්ෂිතව පැවතීම ඉන්දියානු ඉතිහාසය කෙරෙහි බලපෑමක් ඇති කිරීම. (ල.14)

03. * බිම්බිසාර රජුගේ දේශපාලන ක්‍රියාවලිය හේතුකොට ගෙන මගධ අධිරාජ්‍යගේ පදනම ශක්තිමත් වීම.
* කෝසල දේවියගේ විවාහය ලිච්ඡවී, විදේහ යන ප්‍රදේශ සමග වූ ඔහුගේ විවාහ සම්බන්ධතා මගින් මගධ අධිරාජයේ බලය ව්‍යාප්ත වීම.
* අජාසත්ව රජුගේ ව්‍යාප්තවාදය බිම්බිසාර රජු සමයේ ග්‍රාමයක් ලෙස පැවති පාඨලී පුත්‍රය අජාසත්ත රජු යටතේ යුද්ධ මධ්‍යස්ථානයක් ලෙස දියුණු වී අගනුවර බවට පත්වීම - පසු කලෙක මෙය ප්‍රධාන දේශපාලන මධ්‍යස්ථානය බවට පත්වීම.
* සිසුනාග පරපුරේ අවසාන පාලකයා ඝාතනය කොට බලයට නන්ද පරපුරේ ආදිතමය වූ මහා පද්මනන්ද මගධයේ බලය ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම.
* බිම්බිසාරගේ පටන් ක්‍රමයෙන් වර්ධනය වූ මගධයේ බලය නන්දයෝ තවත් ප්‍රදේශ රැසකට ව්‍යාප්ත කිරීම.
* ඛාරමේලගේ හතිගුම්හා සෙල්ලිපියට අනුව නන්දවරු කාලිංගය ද ජය ගැනීම.
* අශෝකගේ දිග් විජය හා පසුව ධර්ම විජය ප්‍රතිපත්ති යටතේ මගධය ලැබූ ජයග්‍රහණ
* චන්ද්‍රගුප්ත මෞර්ය විසින් ගොඩනැගූ අධිරාජ්‍ය බින්දුසාර විසින් ශක්තිමත් පදනමකින් ඉදරියටම ගෙන ඒම හා ව්‍යාප්ත කිරීම - ඉන් පසු අශෝක විසින් එය තව දුරටත් පුළුල් කිරීම මගින් මගධයේ නැගීම එහි උච්චතම අවස්ථාවට පත්වීම ආදිය විස්තර කිරීම. (ල.14)

04. (i) මෝටිමර් වීලර්, අර්නස්ට්, ජේ.එච්.මැකේ, ජෝන් මාර්ෂල්, ආර්.ඩී. බැනර්ජි, කණිංහැම්, පිගොට්, ඩික්සිත්, රායි බහදුර්, දයාරාම්ශානි

(ii) මෙහෙන්ජොදාරෝ - සින්දු ගඟ හරප්පා - රාවි ගඟ

(iii) * ජගන් මාතා හෙවත් මව් දෙවගන වන්දනය - ප්‍රධාන ආගමික ඇදහිල්ලක සශ්‍රීකත්වය, මාතෘත්වය, කසාබව, මුල්කරගෙන මව්දෙවගන වන්දනා කර ඇත. පොළොව මහී කාන්තාව ලෙසද, වන්දනා කරන්නට ඇත. සශ්‍රීකත්වයේ සංකේතය ලෙස සලකා පොළොවට වදින්නට ඇත. විශ්වයේ දෙවඟන, භූමියට අධිපති දෙවගන ලෙස මෙම වන්දනා ක්‍රමය තිබෙන්නට ඇත.
  * පුරුෂ දෙවියා හෙවත් පශුපති වන්දනය - හුණුවලින් තැනූ පූජක රූපයෙහි හිස අඩක් මුඩු කර ඇත. රැවුල මනාව පීරා ඇත. වම් උර වැසෙන සළුවකි. තැනින් තැන දුම්වැදී කළු පැහැ ගැන්වී තිබීමෙන් පෙනී යන්නේ සුවඳ දමූ අල්ලා පුජෝපහාර කළ බවයි.
  * ලිංග හා යෝනි වන්දනාව :- කේතු රූපාකාරව හා රවුම් ගල් වස්තූන් කීපයක් හමුවීමෙන් මෙකල ලිංග හා යෝනි වන්දනාව තිබූ බව.
  * සත්ව වන්දනාව - ටොරකොටාවලින් තැනූ සත්ව රූප හා මුද්‍රාවල සත්ව රූප මෙයට සාක්ෂි දරයි. සතුන් හා දෙවිවරුන්, අර්ධ මිනිස් රූප, අර්ධ සත්ව රූප ද හමු වී ඇත. කඟවේනා, මොල්ලිය හා අං සහිත ගවයා, ඇති ව්‍යාඝ්‍රයා, නාගයා වැනි සතුන් වන්දනා කරන්නට ඇත. කඟවේනා රූපයෙන් විෂ්ණු දෙවියා නිරූපණය කරන බවටද මතයක් ඇත.
  * වෘක්ෂ වන්දනාව - ත්‍රිශූලාකාර හිස්වැස්මක් ඇති දෙවියා සිටින ඇසතු ගස යට මිනිසෙකු වන්දනා කරන මුද්‍රාවක් හමු වී ඇත. එසේම ඇසතු, පිප්පලී නුග, තුල්සි වැනි ශාකවලට එකල වන්දනා කරන්නට ඇත.
  * ජල වන්දනාව - මෙහොන්ජොදාරෝවේ මහා නාන තටාකය ප්‍රධාන ආගමික ගොඩනැගිල්ලක් ලෙස සලකයි. ජලය වැදුම් පිදුම් කිරීම සඳහා නාන තටාකය භාවිතා කරන්නට ඇත. නදී දෙවියන්ගේ දේවාලය ලෙස ද එය සලකන ලද ඵලය අවශ්‍ය වූ නිසා කෘෂි කර්මාන්තයට හා මිනිස් පැවැත්ම සඳහා ඵලය අවශ්‍ය වූ නිසා ඵලයට ගරු සරු කිරීමට මිනිසුන් පුරුදු පුහුණු වන්නට ඇත.
  * ගිනි දෙවියා පිදීම - ආයාතකාර බරාදයක බිත්තිවලින් වට කළ කොටසක පොළොව ගඩොල් අල්ලා තනා ඇත. මෙහි ගිනි දල්වා ගිනි දෙවියන් පුදන්නට ඇත.
  * හිරු වන්දනය - නටඹුන් අතර හමු වූ මුද්‍රාවල ස්වස්තික ලකුණු දක්නට ලැබේ. ස්වස්තිකය බැබිලෝනියන් ශිෂ්ටාචාරයේ හිරු දෙවියන් වන්දනය සංකේතවත් කරයි. හරප්පා වැසියන් ද මේ ආභාෂය මත හිරු වන්දනාව කරන්නට ඇත. මෙවැනි ඇදහිලි ක්‍රම පැවති බවට විවිධ මුද්‍රා, ප්‍රතිමා හා රූප හමු වී ඇත. ඒවා පිළිබඳව විස්තර කරමින් එකළ පැවති ආගමික විශ්වාස ගැන පැහැදිලි කිරීම යෝග්‍ය වේ.

(iv) * ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර 02 වන්නේ මොහොන්ජොදාරෝ සහ හරප්පා නගරයි. මේවාට අමතරව රංග්, පුර්, ජුදෙයිජොදාරෝ කලිබංගන්, රූපාර්, ගෙඩ්ඩිජ්, වැනි නගර තිබූ බවට සාක්ෂි ලැබේ. මේවායේ ක්‍රමානුකූල නගර සැලැස්මක් තිබූ බවට සාධක ලැබේ.

* මෙහි සැලසුම් සහගත රේඛානුකූලව විහිදුනු මාර්ග පද්ධතියක් තිබිණි. මීටර් 3 - 10 දක්වා පළල 1 1/2 Km පමණ දුරට විහිදුනු මාර්ග තනා තිබුනි. මේවායේ පිළිස්සුනු ගඩොල් අතුරා තනා තිබුණි. එමෙන් මාර්ග දෙපස කානු පද්ධති ක්‍රමානුකූලව සකසා තිබුණි.
* ඉඩකඩ සහිත නිවාස තිබුණි. මැද මිදුලත් සහිත ප්‍රභූ නිවාසද ගැනූ බවට සාක්ෂි ලැබේ.
* උසස් ගෘහ නිර්මාණ ලක්ෂක දක්නට තිබිණි. කම්කරු හා ප්‍රභූ නිවාස වෙන් වෙන්ව තිබිණි.
* ඇතුල් නුවර ප්‍රාකාර හා බලකොටුවලින් නිර්මාණ කර තිබුණි. නගරයට ඇතුල් වීමට විශාල දොරටු හා කොටු පවුරු මත මුර අට්ටාල ගනා තිබූ බවට සාධක ලැබේ.
* විශාල ගොඩනැගිලි ඉදිකර තිබුණි. නාන නටාක, රැස්වීම් ශාලා, ශාස්ත්‍ර ශාලා, ධනාගාර, මහල් නිවාස, ඉදිකර තිබූ බවට සාධක ලැබේ. සෑම නිවසකම නාන කාමරයක් තිබූ බවට තොරතුරු ලැබේ. සමාජයේ විවිධ ජන කොටස් හා වෘත්තිකයක් සඳහා ද නිවාස තනා තිබුනි. ධානාගත්තේ පැත්තක නිවාස පේළි හමු වී ඇත.
* හිරු එළියෙන් වේලන ලද ගඩෙල් හා පිළිස්සු ගඩොල් ගොඩනැගිලි තැනීමට භාවිතා කර ඇත. බිත්ති ලම්බාකරව බැඳ තිබීමෙන් ලඹ කැට භාවිතා කර තැනූ විශ්වාස කරයි. පැතලි වහල දැවයෙන් හා මැටියෙන් තනන්නට ඇත.
* සුවිශාල කුලුණු සහිත ශාලා තනා තිබුණි. මාර්ග ආලෝක කිරීම සඳහා වීදී පහන් තිබූ බවට තොරතුරු ලැබේ. එසේම දියුණු සෞඛ්‍ය හා සනීපාරක්ෂක ක්‍රම භාවිතා කර ඇත. සැලසුම් සහගත කාණු පද්ධතිය තුළින් නගරය තුළ පිරිසිදු බව රැකගන්නට ඇත.
* දියුණු දේශීය හා විදේශීය වෙළඳපලක් තිබෙන්නට ඇත.

05. * ඉන්දීය ඉතිහාසයේ පහළ වූ අතිශයින්ම වැදගත් රජු ලෙස ඉතිහාසගත වේ.
* ආරම්භයේදී නන්ද පාලකයන් යටතේ ඇති වූ කිසියම් මතභේදයක් හේතුවෙන් ඔවුන්ගෙන් ඉවත්ව ගොස් එවක වයඹ දිග ඉන්දීයාවේ සිටි ග්‍රීක රජු ඇලෙක්සැන්ඩර් වෙත ගොස් එම රජුගේ සහාය ඇතිව නන්ද පාලකයන් පරාජය කිරීමට උත්සාහ ගත් බව ග්‍රීක වාර්තාවල සඳහන් වේ.
* ධනනන්දගේ පාලනය කෙරෙහි අප්‍රසාදය ඇති කරගෙන සිටි ජනතාවගේ සහායද චන්ද්‍ර ගුප්ත ලැබුණු බව.
* ක්‍රි.පූ. 321 දී චන්ද්‍රගුප්ත රජු මගධ රාජ්‍යයේ සිංහාසන රූඪ වීමත් සමඟ ඉන්දියාව ඉතිහාසයේ ඉතාමත් වැදගත් රාජවංශයක් වූ මෞර්ය රාජ වංශය ආරම්භ වීම.
* උත්තර භාරතයට යටත් කර ගැනීමට තරම් යුධ ශක්තියක් චන්ද්‍ර ගුප්ත රජුට සිටීම. ඒ අනුව සෑම ප්‍රදේශයකට සිටි ග්‍රීක මැසිඩෝනියානු හමුදාවක් ඉන්දියාවෙන් ඔබ්බට පලවා හැරීමට ඔහුට හැකිවීම.
* ඉන්දීය ඉතිහාසයේ සඳහන් වන පරිදි ග්‍රීක ගැනි බවින් ඉන්දියාව මුදාගත් ඉන්දීය නායකයා වූයේ සන්ද්‍රා කොට්ටාස් හෙවත් චන්ද්‍ර ගුප්ත රජුය.
* චන්ද්‍ර ගුප්ත රජු චතුගේ රාජ්‍ය පාලනය සමය තුළ දක්ෂ බ්‍රාහ්මණයා ඉතා කුට දේශපාලඥයා දක්ෂ පාලකයකු ලෙස කටයුතු කළ බව ජස්ටින් ප්‍රකාශ කර ඇත.
* ක්‍රි.පූ. 305 දී සෙලියුකස් නිකේටර් ඉන්දු නදිය තරණය කොට, චන්ද්‍ර ගුප්ත රජු සමග සටන් කොට අවසානයේදී රජු සමඟ ගිවිසුමකට එළඹ තමන් සතුව පැවති ඒරියා, ඇරකෝෂියා, පරාපනිසදේයි හා ගොඩ්‍රෝෂියාවෙන් කොටසක් ද චන්ද්‍රගුප්ත රජුට පවරා දී ඇත.
* චන්ද්‍ර ගුප්ත රජු නන්දයන්ගෙන් හා ග්‍රීකයන්ගෙන් රට මුදවාගෙන තම මෞර්ය රාජධානියේ බලය වයඹ දිග ඉන්දයාව උතුරු ඉන්දියාව හා දකුණු ගදි ඉන්දියාවේ අවසන් කොටස හැර සෙසු ප්‍රදේශ දක්වා පතුරුවමින්, ඉන්දියාවෙන් පිටතට ද තම රාජ්‍ය බලය පතුරුවා ඉන්දීය ඉතිහාසයේ ප්‍රථම අධිරාජ්‍ය බිහි කළ බව. ආදී වශයෙන් විස්තර කරන්න.

06. i. කුමාර ගුප්ත / ස්කන්ධ ගුප්ත ii. තෝරමාන / මිහිරකුල iii. සින්ධි / රාජ්පුතානා / මාල්වා
iv.

* ක්‍රි.ව. 5 වන සියවසේ හුණවරුන් 'ඔක්සස්' නදී නිම්නය අල්ලා ගැණීමත් සමඟ පර්සියාවටත් ඉන්දියාවටත්, බලවත් තර්ජනයන් වූ හුණ ආක්‍රමණ මැඩ පවත්වා ගුප්ත අධිරාජ්‍යයේ ජයග්‍රහණ ලබා දීමට ස්කන්ධ ගුප්ත රජු සමත් වීම.
* වයඹ දිග ඉන්දියාවට එල්ල වුණු හුණ ආක්‍රමණවලින් ඉන්දියාව මුදා ගැනීමට ස්කන්ධ ගුප්ත සමයේ සිදු වූ වැදගත්ම කාර්ය සංසිද්ධිය වුවද, යුද්ධය සඳහා වැය වූ විශාල ධනස්ධන්ධය නිසා ඇති වූ ආර්ථික පරිහානියට හා ඉන් අනතුරුව එල්ල වුණු හුණ ආක්‍රමණ වලට මුහුණ දිය හැකි ශක්තිමත් පාලකයක් නොවීම නිසා ස්කන්ධ ගුප්ත රාජ්‍ය ආක්‍රමණය කරමින් පංජාබයේ ඔවුන්ගේ බලය පිහිටුවා ගත් අතර ඉන් අනතුරුව 'සන්ධි' රාජ්පුතානා හා වාල්වා යන ප්‍රදේශ අල්ලා ගැනීමට ක්‍රියා කිරීම ආදී වශයෙන් විස්තර කරන්න.

07.

* බිංදුසාර රජුගේ අවෑමෙන් මගධ අධිරාජ්‍යයේ සිහසුසනට පත්වීම.
* කාලිංග යුද්ධයෙන් සිත් තැවුලට පත් අශෝක රජු තම දිග් විජය ප්‍රතිපත්ති අතහැර ධර්ම විජය ප්‍රතිපත්තියට අවතීර්ණ වීම.
* බුදු දහම වැළඳ ගැනීමෙන් පසු ධර්ම කටයුතුවල නියැලුණු අශෝක රජු අශෝක ධර්මය ප්‍රචාරය කළ බව ඔහුගේ සෙල්ලිපිවලින් හෙළි වීම.

* එම ලිපිවල ත්‍රිපිකයේ සඳහන් පාඨ උපුටා දක්වා ඇති අතර ශ්‍රමණ බ්‍රාහ්මණයින්ට, දෙමාපියන්ට, වැඩිමහල්ලන්ට හා බන්ධනාගාරාගත වුවන්ට කළ යුතු යුතුකම් ගැන සඳහන් කර ඇත.
* දිල්ලි තෝප්‍රා ලිපියේ සඳහන් පරිදි යහපත් දෑ බොහෝය. කරුණාව, දන්දීම, සත්‍යවාදී බව, පිරිසිදු බව හෙවත් චරිත ශුද්ධිය යන මේවා කළ යුතු බව.
* දෙපා, සිවුපා සතුන් කෙරෙහිද, පක්ෂීන්, මත්ස්‍යයින් කෙරෙහිද ප්‍රාණ දානය හෙවත් අභය දානය යදි යුතු බව.
* මව්පියන්ට හා වැඩිහිටියන්ට කීකරු වීම, සතුන් කෙරෙහි දයාව කරුණාව දැක්වීම, හැසිරීම, ගුරුවරුන්ට වතාවත් කිරීම, නැදෑ හිත මිතුරන්ට හා වැඩිහිටියන්ට කීකරු වීම මහණ බමුනන්ට සංග්‍රහ කිරීම සහිත බව, දැසි දස්සන් කෙරෙහි දයාව දැක්වීම අදිය අශෝක ධර්මයේ අඩංගු ප්‍රධාන කරුණු වේ. මේවා දක්වා ඇත්තේ රට තුළ සමාකාමී රාජ්‍යක් ගොඩනැගීමටයි.
* ධෞලි ගිරි ලිපියේ, සියලුම මිනිසුන් මාගේ දරුවෝය' සඳහන් තීරණයෙන් සිඟාලෝවාද සූත්‍රයේ ගිහි විනය ප්‍රකට බව සඳහන් පිළිගත හැකිය. ඒවා පිළිපැදීමෙන් සියලු දෙනා අතර සාමයක් ගොඩ නැගෙන බව.
* යාගහෝම හා සතුන් මැරීම වැළැක්වීම, මුව දඩයම වැළැක්වීම.
* නිකරුණේ කැලෑ ගිනි තැබීම වැළැක්වීම, පොහෝ දිනවල සතුන් මැරීම, තහනම් කිරීම, පක්ෂීන්ට අභය දානය දීම, රජගෙදර ආහාර පිණිස සතුන් මැරීම සීමා කිරීම වැනි ක්‍රියා මාර්ග ඔහුගේ අරමුණු මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමෙන් සාමාකාමී පරිසරයක් ඇති කිරීමට උත්සාහ කළ බව.
* රාජ්‍ය තුළ ධර්මා ප්‍රචාරක කටයුතු සිදු වූ අයුරු සොයා බැලීමට ධර්ම මහා මාත්‍රා නම් නිළධාරිහු පත් කිරීම, ඔවුන් පංච වාර්ෂිකව සංචාරකය කොටස් පිළිබඳව සොයා බැලීම.
* තුන්වන ධර්ම සංඝායනවා පවත්වා රටවල් නවයකට ධර්ම දූතයන් යැවීමට කටයුතු කිරීම.
* රජු සෑම ගමකට මිනිසුන් උදෙසා මෙන්ම සතුන් උදෙසාද රෝහල් ඉදිකිරීම.
* ගිමන් හල් කරවීම, මාර්ග අසල දෙපස ගස් සිටුවීම, මාර්ග අසල ළිං, පොකුණු ඉදිකිරීම, පැන්නලි තිබීම, බෙහෙත් උයන් ඉදි කරවීම, ආදි කරුණු විස්තර කරන්න.

08. i.

* වයඹ දිග ඉන්දියාවට එල්ල වූ ආක්‍රමණ අතර සින්ධ වලට එල්ල වූ අරාබි ආක්‍රමණ අංශ කීපයක් යටතේ වැදගත් වීම.
* ඉස්ලාම් ආගම පැතිරවීම. වෙළෙඳ බලය අල්ලා ගැනීම.
* ධනය කොල්ල කෑම.
* මෙම ආක්‍රමණ සඳහා වරින් වර මුහුදින් හා ගොඩබිමින් ඉන්දියාවට ආක්‍රමණ එල්ල කිරීම.
* ක්‍රි.ව. 637 දී බොම්බායේ තානා ප්‍රදේශයට ද පසුව බ්‍රෝච් හා දෙබාල්වලට කළ ආක්‍රමණ අසාර්ථක වීම.
* ක්‍රි.ව. 712 දී සන්ධවලට කළ ආක්‍රමණ සාර්ථක වීම.
* මොහොමඩ් බින් කාසිම් යටතේ විශාල හමුදාවක් පැමිණ දෙබාල් නගරය අල්ලා ගැනීම. සන්ධි පාලකයා මරණයට පත්වීම.
* කාසිම් මුල්තාන් යටත් කර ගැනීම. එයින් ප්‍රථම වරට ඉන්දියාවේ ප්‍රදේශයක් අරාබි පාලනයට යටත් වීම.
* ඉරාක ආණ්ඩුකාර හජ්ජි - බින් - යුසුප් මෙම ආක්‍රමණය මෙහෙයවීම.
* ආරබීන් සින්ධි පාලනය කළේ කෙටි කලකකට වුවද එම පාලනයේ බලපෑම් අතර ඉන්දියාවේ හා ආරබීන් අතර වෙළඳ සබඳතා වර්ධනය හා ආරබීන් සින්ධි ප්‍රදේශයේ පදිංචි වීම කැපී පෙනෙන ලක්ෂණයක් වීම. ආදී වශයෙන් විස්තර කරන්න.

(ii)

* ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ ජනපද ව්‍යාප්තියක් ආරම්භ වීම.
* වෛදික ආර්යයන් ගංගා, යමුනා ආශ්‍රිත මධ්‍ය ඉන්දියාවට පැමිණීමත් සමග එම ප්‍රදේශවල මහා ජනපද ආරම්භ කර ඒවායේ ජීවත් වීම.
* එවැනි ජනපද 16 ක් ගැන සඳහන් වූ අතර ඒවා සොලොස්මහා ජනපද නමින් හැඳින්වීම.
* අංග මගධ, කාසි, කෝසල.....
* මේවායින් ගන්ධාර හා කාම්බෝජ ජනපද දෙක ආර්යයන් පදිංචිවූ වයඹ දිග ඉන්දියාවේ පැවැති අතර දක්ෂිණ අස්මක ජනපද ව්‍යාප්ති වීමෙන් පැහැදිලි වන්නේ වින්ධ්‍යාවෙන් දකුණට ද ආර්යයන් ව්‍යාප්ත වූ බවයි.
* අනෙක් ජනපද 13 ම ගංගා යමුනා ආශ්‍රිත මධ්‍ය ඉන්දියාවේ ව්‍යාප්ත වීම. මේවායේ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම 02 තිබීම.

  01. රාජාණ්ඩු පාලන ක්‍රමය 02. සමූහාණ්ඩු පාලන ක්‍රමය
* ඒකාධිපතිත්වයෙන් පාලනය වූ ආණ්ඩු, රාජණ්ඩු ලෙස හැඳින්වීම. එවැනි ප්‍රධාන රාජ්‍යයන් හතරක් තිබිනි. මගධ,කෝසල, වත්ස, අවන්ති
* තවත් ගණ, සංඝ හෙවත් සමූහාණ්ඩු ලෙස තිබූ රාජ්‍ය කීපයක් ගැන ද තොරතුරු ලැබේ. එම ජනපද අතරින් වජ්ජි හා මල්ල රජවරු සමුහාණ්ඩු පාලනයක් ගෙන ගිය අතර බෞද්ධ සාහිත්‍යයේ එසමුහාණ්ඩු පාලනයක් ගෙන ගිය අතර බෞද්ධ සාහිත්‍යයේ එවැනි සමුහාණ්ඩු පාලනයක් ගෙන ගිය අතර බෞද්ධ සාහිත්‍යයේ එවැනි සමුහාණ්ඩු නවයක් ගැන සඳහන් වේ.
* බුද්දකාලීන භාරතයේ ජීවත් වූ තවත් ස්වාධීන ජන කණ්ඩායම් රාශියක් ලෙස ඒවා හැඳින්විය හැක.

කපිලවස්තුවේ ශාක්‍යයෝ — වෛශාලියෝ - ලිච්ඡවීන්
කුසිනාරා සහ පාවා නුවර මල්ල රජවරු — අල්ලකප්පයේ - බුලියවරු
මිථිලාවේ - විදේහවරු — රාම ග්‍රාමයේ - කෝලියවරුන්
කේසපුත්තයේ -කාලාමවරු — පිප්පලීවනයේ - මෝරියවරු
සුංසුමාරගිරියේ - භග්ගවරු

* ලිච්ඡවී රජවරු 7707 සිටි බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ.
* ඔවුන්ගේ පාලන කටයුතුවල කැපී පෙනුණු ලක්ෂණය වුයේ සප්ත අපරිහානී ධර්ම අනුගමනය කිරීමයි.

iii.

* ගුප්ත පාලකයන් යටතේ ඉන්දියාවේ ස්වර්ණමය යුගයක් ගොඩ නැගීම.
* ගුප්ත රජවරුන් සාහිත්‍ය දියුණුවට විශාල සේවයක් සිදු කිරීම.
* සංස්කෘතික කලාව සාහිත්‍යමය භාෂාවක් ලෙස උපරිම දියුණුවක් ලැබීම.
* ආගම, දර්ශනය, ධර්ම ශාස්ත්‍ර, නාට්‍ය ශාස්ත්‍රය, ව්‍යාකරණ ජ්‍යොතිෂය තර්ක ශාස්ත්‍රය, ගණිතය, වෛද්‍ය ශාස්ත්‍රය වැනි විවිධ ක්ෂේත්‍රවලින් ග්‍රන්ථ මෙකල බිහිවීම.
* උගත් පඩිවරු මෙකල බිහිවීම.
* II වන චන්ද්‍රගුප්ත රජුගේ රාජ සභාව නවරත්න නම් කවීන්ගෙන් සමන්විත වේ. ඒ අතර සිටි කාලිදාස මෙකල ශ්‍රේෂ්ඨ ගණයේ උගතෙකු වීම. මොහු විසින් සාකුන්තලය, මාලවිකාග්නි මිත්‍ර, වික්‍රමෝර්වර්ගි යන නාට්‍ය ග්‍රන්ථ ද, මේඝ දූතය, ඍතු සංහාරය, යන කාව්‍ය ග්‍රන්ථ ද රචනා කිරීමය.
* සංස්කෘතික සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨ මහා කාව්‍ය දෙකක් වූ කුමාර සම්භවය හා රඝු වංශය ද මෙකල රචනා වීම.
* විශාඛ දත්ත, ශූද්‍රක, අමරාසිංහ, භාරවී යන අය ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ රචනා කිරීම.
* ගණිතඥයකු හා විද්‍යාඥයකු වූ ආර්‍යභට විසින් රචනා කරන ලද ආර්ය භට්ටිය හා සූර්ය සිද්ධාන්ත යන ග්‍රන්ථ වල ගණිතය, ජ්‍යාමිතිය, අංක ගණිතය ශුද්ධ ගතිකය, යන විෂයන් අඩංගු වීම ආදී වශයෙන් විස්තර කරන්න.

iv.

* කුෂාණ යුගයේ රජවරු අතර කණිෂ්ක රජු ශ්‍රේෂ්ඨතමයා වූ අතර ඔහුගේ උනන්දුව හා අනුග්‍රහය බෞද්ධ සංස්කෘතික අභිවර්ධනයට බලපෑම.
* මෙම යුගයේ රජවරු බුදු දහමට අනුග්‍රහය දැක්වූ අතර මහායාන බුදු දහමේ වර්ධය තුලින් හතරවන ධර්ම සංඝායනා පැවැත්වීම.
* බෞද්ධ ධර්ම දූත කටයුතු ආරම්භ කිරීම, මධ්‍ය ආසියාවට බුදු දහම ව්‍යාප්ත කිරීම. බෞද්ධ පඩිවරුන්ට අනුග්‍රහ දැක්වීම. මෙම යුගයේ විශිෂ්ඨ ලක්ෂණ වීම.
* කණිෂ්ඛ රජු අබෞද්ධයක වුවද පසුව බෞද්ධයකු වූ බව
* හිඵුංසාං හිමියන් පවසන පරිදි මහල් ගණනාවකින් යුත් ධාතු මන්දිරයක් මොහු විසින් තනවා තිබීම.
* කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් භික්ෂූන් 500 නමකගේ ප්‍රධානත්වයෙන් සිව්වන ධර්ම සංඝායනාව පැවැත්වීම.
* මෙම සංඝායනාවේදී විභාෂා නමින් හැඳින්වූ අටුවා ග්‍රන්ථ රචනා වී ඇත. සූත්‍ර පිටකයට උපදේශ ශාස්ත්‍ර යන පොතද, විනය පිටකයට විනය විභාෂා යන පොතද, අභිධර්ම පිටකයට මහා විභාෂා යන අටුවා ග්‍රන්ථය ද රචනා වූ අතර මෙම සංඝායනාවේ භාෂා මධ්‍ය වුයේ සංස්කෘත භාෂාවයි.
* ආගමික සහශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
* ගන්ධාර, මථුරා වැනි කලා සම්ප්‍රදායයන් බිහිවීම. බුද්ධ ප්‍රතිමාකරණය වැනි නව ප්‍රවර්තා ඇතිවීම. ආදී ලෙස විස්තර කරන්න.

09. A

* චෝළ අධිරාජ්‍යයේ ප්‍රබල රජවරුන් යටතේ චෝල බලය ඉන්දියාවෙන් පිටත ව්‍යාප්ත වීම.
* I රාජ රාජ හා I රාජේන්ද්‍ර යටතේ චෝළ බලය වර්ධනය
* චෝළ අධිරාජ්‍ය බලය දේශපාලන, වාණිජ හා සංස්කෘතික වශයෙන් ඉන්දියාවෙන් ඔබ්බට ව්‍යාප්ත වීම.
* කේරලයේ නාවික හමුදාව යටත් කොට ගෙන අල්ලා ගෙන ඒ මගින් පැසිපික් දූපත් දක්වා බලය ව්‍යාප්ත කිරීම.
* දූපත් දොළොස්දාහ නම් වූ ලංකාව හා මාලදිවයින අල්ලා ගැනීම වැදගත් වීම.
* I රාජ රාජ ලංකාවේ අනුරාධපුරය අල්ලා ගෙන එම ප්‍රදේශය මුම්මඩි චෝළ මණ්ඩලම් නමින් හැඳින්වීම.
* පොළොන්නරුව ජනනාථපුර නමින් හැඳින්වීම.
* මේ නිසා රාජ රාජ මුම්මඩි චෝළ, පාන්ඩ්‍ය කුලාශාහි, කේරලාන්තක, තෙලිඟු කුලකාල යන විරුද නාමවලින් හැඳින්වීම.
* සෙල්ලිපි වලට අනුව රාජෙන්ද්‍ර චෝළ බෙංගාලයට ප්‍රහාරයක් එල්ලකොට ගංගා නදියේ ශුද්ධ වූ ජලය දකුණු චෝළ රාජ්‍යයේ ඉදිකළ ගංගෙයි කොණ්ඩි චෝළ පුරම්හි වැවට යොමු කොට සිය බලය පෙන්වීම.
* අග්නිදිග ආසියාවට ආක්‍රමණ එල්ල කරමින් පළමුව අන්දමන් හා නිකොබාර් දූපත් යටත් කර ගැනීම.

* ශ්‍රී විජය රාජ්‍යයට ආක්‍රමණයක් එල්ල කරමින් එහි ශෛලේන්ද්‍ර රජු සිර කොට කඩාරම් හෙවත් කෙඩා බලකොටුව අල්ලා ගැනීම.
* ඒ නිසා 'කඩාරම් කොණ්ඩ' යන විරුද නාමයෙන් ද රාජෙන්ද්‍ර හැඳින්වීම.
* මෙම ආක්‍රමණ සමගම සුමාත්‍රා, කඩාරම්, මලයානු අර්ධද්වීපය හා පහළ බුරුමය තමා යටතට පත් කරගෙන චෝළ බලය අග්නිදිග ආසියාවට ව්‍යාප්ත කිරීම.
* මේ අනුව I රාජ රාජ හා රාජේන්ද්‍ර කාලවලදී චෝළ බලය ඉන්දියාවේ පමණක් නොව ඉන්දියාවෙන් පිටතද වයාප්ත වීම.

B

* පල්ලවයන් යටතේ ඔවුන්ගේ ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති, කැටයම් ආගම හා සාහිත්‍ය යන අංශවල ඇති වූ වර්ධනය
* කාංචිපුරය හා මහාබලිපුරම් නගර මුල්කොට ගෙන ගෘහ නිර්මාණ ලක්ෂණ දක්නට ලැබීම.
* පර්වත හාරා කුළුනු සහිත දේවාල කැනීම මහේන්ද්‍ර ශෛලිය ලෙස හැඳින්වීම.
* පළමු නරසිංහ වර්මන් කාලයට අයත් මහාබලිපුරම්හි රථ හා මණ්ඩප ඉදිකිරීම, කෛලාසනාථ දේවාලය ඉදිකිරීම මාමල්ල අවධිය ලෙස හැඳින්වේ.
* මෙකල හින්දු ආගමේ ප්‍රබෝධයක් ඇතිවීම.
* ශෛව හා වෛශ්ණ ආගමික නිකායන් බලවත් වීම.
* මෙකල බෞද්ධ හා ජෛන ආගම් ද ව්‍යාප්ත වීම.
* මෙකල සංස්කෘතික සාහිත්‍යය ද දියුණු වීම.
* පල්ලව ග්‍රන්ථාක්ෂරවල ආභාෂය ලංකාව ඇතුළු අග්නිදිග ආසියාතික රටවලද ප්‍රචලිත වීම.
* I වන මහේන්ද්‍ර වර්මන් කාලයේ සාහිත්‍ය කටයුතු දියුණු වීම. රජු මත්ත විලාශ ප්‍රහසන' නම් නාට්‍ය හා දක්ඛිණ චිත නම් ග්‍රන්ථය රචනා කිරීම.
* II වන නරසිංහ වර්මන් රජුගේ රාජ සභාවේ සිටි දණ්ඩීන් කවියා දශ කුමාර චරිතය හා නාට්‍ය දර්ශනය යන ග්‍රන්ථ රචනා කිරීම ආදී වශයෙන් විස්තර කරන්න.